# කිවියර සන්නස

### නැග බැලීම

කඳු මඩුලු වෙත ඇරුණු
පාළු
පටු
තැනි බිමෙහි සිට
දුටු එක ම
උස ම උස
ගිරි මුදුන
නැග බලන

එක් සැණින්
මහත් ආකාශ ධාතුව ම
රිසි විලස වළඳින
තව උදාරම්
ගිරි ශිඛර
මා නැගි ගිරග පරයා
නුදුරු කඳු වැටි පළා
පැන නැගිණි!

ප්‍රපාතයෙහි ම බැස
එහි ම වැද හිඳිනා දන
අසමසම මුදුනැ' යි
සදා නමදින
මේ ගිර
අනෙක ගිරි පවුරු මැද
වහා මිටි වුණු මහිම!

ඒ ආශ්චර්ය දකිනුව නැග බැලිය යුතු ම ය
ඉක්මවා
පාළු
පටු
තැනි බිම

**නන්දන වීරසිංහ**
**ගිරග (1997)**

### නොරැඳි සෙනෙහේ අකුරු3

පොඩිකමට
බහින්නට
සාක්කුවක් නොතිබුණි
කුඩා කල මට,
...නුඹ???

දුක දැනුණු විට
අල්ලන්නට
අතැගිල්ලක් නොතිබුණි
කෙදිනක දී වත් මට,
...නුඹ???

රුදුරු මේ මග
මුවා වෙන්නට
මහා මේරුවක් නොවිණි
සිහිනෙකින්වත් මට
...නුඹ???

ජීවන ගමනේ
මා වැන්නවුන්නට
උන්ගෙ උන්
අත්වැල් වන විට
ම'නෙත ඉදිරිපිට
...නුඹ???

හුදෙක් සිහිනයක
සේයාවක් ම විය
බොඳ වූ උණු කඳුළු මත
..........
සඳහටම
...නුඹ
...මට,

**පී. එම්. මධුශානිකා**

## හෝමෝ සේපියන්,

උඹ තව ම එතැනම යි
උඹේ සීයා ගහෙන් බැස්ස
තැනම යි
වෙනසකට ඇත්තේ කෙලින් වුණු
කොඳු නාරටි විතරම යි

ගල් යුගේ දැක්ම යි
අද කාලේ ඇස් දෙක යි
වානේ හදවතයි අරන් උඹ
තාම හොයනවා
හොය හොයා ඇවිදිනවා
පුරාණ කැළේ ඇතුළෙම
උඹෙ පරණ රංචුවම

දැක්කොත් බැරිවෙලාවත්
වෙනස් තාලේ එකෙක්
උඹ මරයි ඒකව
කටිනුත් අතිනුත්
බෙල්ලෙන්ම අල්ලලා
පපු කැවුතු ඉරලා
හෝමෝ සේපියන්
උඹ තාම එතනම යි

**නදීශාන් හේරත්**

## අප්පච්චී.....

රැයේ කළුවර මුදුනතින් ගෙන,
ගඟනේ විසිරුනු තරු රටා නෙක,
තුන්යමේ මා හැඬූ දවසක
තරු ගැන කීවා නිදි නැති දෙනෙතට.....

මව්පදවිය ලොව දෙවෙනි ද කා හට
පියවරු නැති ලොව මව්වරු ඇතිවෙද,
ලේ කිරි නොව්වත් පියකුගේ ලෙය තුළ
දරු සෙනෙහස ඇති මහමෙර තරමට.....

නොනිදා ගත කළ රැයවල් අපමණ
දිවියේ දුක්ගැට උහුලයි දරු පෙම
දාහය විසිකර වපුරන දහදිය,
නොලැබුව සුව සැප නුඹට විඳින්නට.....

**එන්.ඩී. විතානගේ**

## පණ හා ජීවිතය

සැඩ පහරේ ගසා ගෙන යන
යුවතියක දෑසේ
"මර බිය" දුටිමි..,
ගොඩගත් විගස ඇ
"විලිබිය දුටිමි"
ඇගේ දෑසේ...

**සදම් යාලුක කස්තුරි ආරච්චි**

## රිවි ගිලී යන සඳ.....

සඳ මඬල මුව කමල    පාලා
සිනාසුණි ලෝ දන    සොයාලා
තාරකා සිය නෙත්    විදාලා
කරත රැඟුමන් මන    වඩාලා

කදෝපැණියන් ආල හැඟුමින් මුකුළු කරමින් පාන    අබිසෙස්
පාලිකාවන් සේ දිලෙයි සේපාලිකාවන් සරා    තුරුහිස්
යාතිකාවන් සේ ඇසෙයි රැහැඟනන් වයනා දාර    සියතත්
ගීතිකාවන් නැඟෙයි මුවඟට වහා නොවලා සිතේ    අමරස්

සඳ වළාවන් වෙලා ආ    සඳ
මඳ කලාවන් පෙලා ආ    ළඳ
ළඳ මනාවන් සලා සිය    බඳ
සඳ සිරින් බැබළී දිලෙයි    කොඳ

කුස් තෙමේ පබවත් සරින් අඹනා ලෙසේ සොඳ    රන්ලියක්
දොස් නොලා හිමවත් දෙසින්, සුදිලෙනා    තඹරාලියක්
වස් බලා රෑ තරු පෙළා, මහී සනහා ඇති    සෙයක්
දොස් හලා සුදු මුදු හැළින්, ඇස් අරා කඩුපුල්    මලක්

**ගෙත්මිණී පුලාරා වික්‍රමආරච්චි**

## රාත්‍රිය වෙමි

විඩාබර තව දිනක් අග මම
සොමි සිතුම් අහුරක්
සදන්නෙමි.
පිණි මුතු ද ගෙන
වළා කෙඳි මත
තරු එළියෙ කවියක් ව
හැඩවෙමි...
සොඳුරු කවි මල්දම් පූජාවකට
මුළු ලොව ම නිසසල ව තබනෙමි...
දොළොස් පැය මිය යන්න කලියෙන්
කවිය නුඹ
නින්දට යවන්නෙමි...
කවි සිතට සුව සේ
නිදන්නට
සඳ එළිය ගෙන
හෙටත් එන්නෙමි...
රෑ කුමරියන් දුන් සුවඳ ගෙන
නුඹ දකින
සිහිනයේ තවරමි...
හෙට තවත් දවසක් ගෙනේවි
කවි සිහින ගෙන
නික්ම යන්නෙමි...

**හසිතා අනුරුද්ධි බණ්ඩාර**

## මං කැම්පස්

| | |
|---|---|
| නොතේරෙන ලෙක්චර්ස් | අස්සේ |
| නින්ද ඇස් | අගිස්සේ |
| සද්දෙට ඉබේටම | ගැස්සේ |
| විඳවනවා පැයක් | තිස්සේ |
| සර් කෑගැහුවත් කන | අස්සේ |
| නොයයි සිත ඒ | ඔස්සේ |
| නිදාගන්නයි ඕන දූන් | සිත්සේ |
| ඉගෙන ගන්නම් අනේ මං | පස්සේ |

**සෞම්‍යා**

## වැලි කතරක වියෝව

ඇහිපිල්ලමක් යට
උණුහුම් ව තිබූ කඳුළැලි
රූරා වැටෙත් ම
ඇගේ ළැම මත
ධවල පැහැගත් ඒ ක්ෂීර බිඳු
වසා අවිහිංසක දෑස් කිරිකැටි
පැතුම් නටඹුන් ශේෂ කරමින්
සැඟවී ගොස් නාඳුනන පොළොවක
සුසුම්ලයි චිත් කඳුළු බිඳුවක...

(සෞදි අරාබියේ දී මරණ දණ්ඩනයට
නියම වී ජීවිතය අහිමි කළ 'රිසානා' ගේ
සිද්ධිය ඇසුරෙනි)

**එම්. එම්. තිසිරි මැදගම**

## යථාර්ථය

සිනහ වෙයන්
- සිනහවට මිලක් නියම නොකරන්...
සුසුම් හෙලන්
- දුක තිවෙනකන් නමුදු සිතින් නොවැටෙන්
කඳුළු හෙළන්
- නෙත් රිදෙනකන් ඒත් හිත හැදෙනකන්
ආදරය කරන්
- සැමට පිරිසිදු සිතින්... නමුදු, පෙරළා එය ම නොපතන්
විඳින්න
- විඳවන්න දෙයක් නොලැබෙනකන්
පසුව නැවත හැරී බලන්
- සිනහව, සුසුම් හෙළු, කඳුළු හෙළු, විඳවපු ජීවිතයක අරුමය

**කේ. එල්. ඒ. ආර්. ජයතිලක**

## සදාතනික ප්‍රේමය

ගිලිහුණු මලක මෙලෙක
පෙති ලෙස නොව,
අත්තක රැඳුණු සුපිපි මල් ගොමුවක
වෙලා මා ළඟම ඉන්න...
ආදර වදනින් ඔබේ ම
ආදරණීය හදවත
මඳකට සෙනෙහසෙන් සතපවාලන්න...
ගැඹුරු නින්දකට නොයන්නට නම්
ඉහ අද්දරට වී
සැනසුම් පවන් මුසුකොට
සුසුම් පොද සිපගන්න...
සදාතනික නොවන ලෝකයෙන්
එබී බලා මට ම, මගේ වූ
සදාතනික ඔබේ
ප්‍රේමය පුද දෙන්න...

**ඩබ්. සී. පී. සිල්වා**

## අහිමි නුඹ

නෙත් දෙකෙන් බලා
හදවතින් නො විමසා
සායමින් සිතුවම් කළ
සමනළයකුට රැවටුනා
මං...

සායමින් සිතුවම් වුණ
ඔබේ බාහිර පෙනුම
නොසිතුවා කිසි විටෙක
වෙන මලක් වෙත යළිත්
පියඹ පියඹා යයි කියා...

අවසර දෙන්නම්
නුඹට,
යන්න ම යන්නට
ආයෙත් කිසිදාක
හමු නොවන්නට
මාව...

**රංගනා විතානගේ**

## නූපන් බිළිඳුගේ මළගම

උත්තුංග මිනිසත්කම්
මොනර කොළවලට යට වී
සිඟිති දරු සුරතල්
කාසි ගිජුකමට සින්න වී
කුස යහන දසමසක්
පුතු නමින් වෙන්කළ නොහැකි වූ තැන,
පුංචි මල් පොහොට්ටුව
පෙති සිඳලිය හැකි වුණි ද?
නූපන් පුතුන්
දිවි යදින කල මව්ගෙන්...

**ඩී. සී. චාරුනී ජයතිස්ස**

## මං මුලා වූ තාරුණ්‍යය

මුහුණු පොතේ පිටු අතර
සැඟවිලා යෞවනය
සයිබර් වනය තුළ
සැරිසරන සිතුවිලි අතර
ජාලයක පැටළුණු
නිසොල්මන් ඇස් අතර
තැනූ සයිබර් මැදුර
යෞවනයේ දෙපා මුල
දිය බිඳක් නොමැති ලොව
පිපාසිතව හතිලමින් පැමිණෙන
කතර මැද තනි වී සිනාසෙන
යෞවනය මං මුලා වී ඇත
අවදි වී ලොව සිහිනයෙන්
මෙට.........
බලන විට ලෝකය දිහා නුඹ
දැනෙයි නුඹ තනි වෙලා බව
එබීයන් මායා දැල ඉරාගෙන........

**ඩබ්.එම්.එන්.කේ. ජයවර්ධන**

## Before the Farewell To My Grandma

False if one says you're losing:
Strength, energy, liveliness with wings of time
Gaining wings from time itself;
Still standing prominent in the household

That secret cave of unknown history,
Vast as the sky, deep as the ocean
Your mind, that bears inwardly
All the happenings of generations

Proudly calming that I inherited
All my success, through your blood,
You pray for my success,
Giving no defeat to my mother
True that you, the second mother of mind!

I too deep inside the conscience,
Acknowledge my failure,
Of not being acquainted with you,
As were in past days
Rigid earthly matters, so naturally,
Draw me away from intimacy!

Not being typical to esteem your spirit,
AFTER FAREWELL
Same as alive, you;
The spirit of all my life an success
So, may this be a prelude, so odd;
To outlive me in this life!

**Sachini Sathsarani Kaluarachchi**

## தாயே சப்ரா...

பேரழகாய் வாழ்விடமான
பெலிகுல் ஓயாவிலே
பேரறிவாளர்களைபெற்றெடுக்கும்
கல்வித் தாயே! சப்ரா...

கனவுகளோடு உன் அடிபணிந்த
கருமை,அருமைக் குழந்தைகளை
கல்வி நீர் ஊற்றி
கடலாய் ஆக்குகிறாய் கல்வியிலே...

பலமொழியை எமக்கு ஊட்டி
பாரினிலே வாழ வழி காட்டி
பல்கலையும் பழகவைத்தாள்
பலவற்றையும் உணரவைத்தாள்...

ஆங்கிலத்தால் அச்சமுள்ள
ஆறறிவு மனிதர்களை
ஆற்றுப்படுத்தி அனுப்பிவைத்தாள்
ஆங்கிலதேசம் ஐ.நா வரை...

விடுதியிலே வேடிக்கைகள்
சடுதியிலே காதல்கள்
கடுதியிலே பரீட்சைகள்
இறுதியிலே கவலைகள்..

கல்விக்கு மட்டுமின்றி
கலைகளுக்கும் கோடுபோட்டு
காட்டிடுவாய் உன் மடியில் - உனை
காலமெல்லாம் வாழ்த்திடுவோம்...

**த.தேவிகரன்**

## ඔබ නිසා මං,

ඔබට ම පෙම් බැඳි
උතුම් අ'දරැති
සැමදා පතිරැකි
යශෝදරා විය මං...

සුන්වුණු පැතුමක
ආලය ගිනියන
ගිනියම් ලොව මැද
කඳුළු වගුරුවන
පටාචාරාව විය මං...

නොලැබෙන ඔබ ගැන
සිතමින් ඉකියන
ඔබ ලැබුමට
අබ බිජු පසු පස යන
කිසාගෝතමිය විය මං...

**චාමිතා නිශාදරී රත්නායක**

## ගුරු පියාණෙනි

සෙනෙහෙ ගඟුලේ පිපුණු
සුවඳ නෙළුමක් විලස...
ලොව ම සුවපත් කරන
බුදු වදන මෙන් ඇසුණු...
දෙනෝ දාහක් වඳින
බෝ රුකක් වන් ඇඳුර...
ඊයෙ අද මෙන් හෙට ද
ලබා දෙනු ඒ ඇසුර,
සියල් දුක් නිවන...

**පී. ඩබ්ලිව්. එන්. රුවන්දි**